# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1979 අංක 18 දරන මහා නගර සභා (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1979 මාර්තු මස 20 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1979 මාර්තු මස 30 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී

---

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැක

මිළ : ශත 20 යි

තැපැල් ගාස්තුව : ශත 25 යි

1979 අංක 18 දරන මහා නගර සභා (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1979 මාර්තු මස 20 වන දින]

එල්. ඩී.—ඕ. 84/78

මහා නගර සභා ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

1. මේ පනත 1979 අංක 18 දරන මහා නගර සභා (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

2. ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 5 දරන පනතින් මහා නගර සභා ආඥාපනතට ඇතුළත් කරන ලද, මහා නගර සභා ආඥා පනතේ 184අ වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:— 252 වන අධිකාරයේ 184අ වගන්තිය සංශෝධනය කිරීම.

(අ) "පළාත් පාලන සේවයේ යම් සාමාජිකයකු" යන වචන වෙනුවට "පළාත් පාලන සේවයේ යම් සාමාජිකයකු හෝ එම සේවයේ සාමාජිකයකු නොවන වෙනත් යම් තැනැත්තකු" යන වචන ආදේශ කිරීමෙන් ;

(ආ) "ඔහු විශ්‍රාම ගත් දිනයේ සිට අවුරුදු දොළහකුත් මාස හයක් වූ කාලසීමාවක් ඉකුත් වූ දිනට පසු දිනය හෝ 1973 ජනවාරි මස 1 වන දිනය" යන වචන හා ඉලක්කම් වෙනුවට "ඔහු විශ්‍රාම ගත් දිනයේ සිට අවුරුදු දහයක කාලසීමාවක් ඉකුත් වූ දිනය හෝ 1977 පෙබරවාරි මස 1 වන දිනය" යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන් ;

(ඇ) "ගෙවනු ලැබිය හැකිය" යන වචන වෙනුවට පහත දැක්වෙන වචන ආදේශ කිරීමෙන් :—

"ගෙවනු ලැබිය හැකිය :

එසේ වුව ද දස අවුරුදු කාලසීමාව ඉකුත්වීමෙන් පසුව එන දිනය මාසයක පළමුවන දිනයෙන් පසු දිනයක් වූ අවස්ථාවක, ඒ විශ්‍රාම වැටුප ආරම්භ වීමේ දිනය ඊළඟ මාසයේ පළමුවන දිනය වන්නේ ය."; සහ

(ඈ) ඒ වගන්තියේ පාර්ශ්ව සටහනෙහි "පළාත් පාලන සේවයේ සාමාජිකයන්ට" යන වචන වෙනුවට "පළාත් පාලන සේවයේ සාමාජිකයන්ට සහ වෙනත් තැනැත්තන්ට" යන වචන ආදේශ කිරීමෙන්.

3. පළාත් පාලන සේවයේ යම් සාමාජිකයකු විසින් මේ පනත ආරම්භ වන දිනයට පෙර මහා නගර සභා ආඥාපනතේ 184අ වගන්තිය යටතේ ලබා ගන්නා ලද යම් අයිතිවාසිකමක් කෙරෙහි මේ පනතේ 2 වන වගන්තිය මගින් ඒ ආඥාපනතට කරන ලද සංශෝධනය හානිකර ලෙස බලපාන්නේ යයි සලකනු නොලැබිය යුතු ය. මේ පනත ආරම්භ වීමට පෙර පළාත් පාලන සේවයේ සාමාජිකයන් විසින් ලබාගන්නා ලද අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.

ඊ 39707—11,800 (79/02)

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත්වල සහ නීතිවල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 30 කි. (විදේශීය) රු. 40 කි. කොළඹ 1, තැ. පෙ. අංක 500, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය. මුදල් ගෙවූ දිනට කලින් නිකුත් කරන ලද පනත් කෙටුම්පත් සහ නීති නොසැපයීමේ කොන්දේසිය මත ප්‍රමාද දායක මුදල් භාරගනු ලැබේ.